# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව.
# අ.පො.ස. (උසස් පෙළ) - පෙරහුරු පරීක්ෂණය - 2024

| සිංහල - 1 පත්‍රය | පැය තුනයි.<br>අමතර කියවීම් කාලය -මිනිත්තු 10 |
|---|---|

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

සැලකිය යුතුයි:
- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- මේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදාගන්න.

(01) පහත දැක්වෙන උද්ධෘත පාඨ අතුරෙන් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) එක්තරා චණ්ඩාල බ්‍රාහ්මණයක්හට දූ ව උපන්හ; එකල්හි පළමු කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් විශිෂ්ට වූ රූ ඇති වූහ. ඔවුනෝග් සියලඟින් විදුලිය කළඹක් වැනි රශ්මි මාලා සමූහයෝ නික්මෙති; හාත්පසින් සතර රියනක් පමණ තන්හි ශරීරාලෝකයෙන් ම අන්ධකාර දුරු ව ඒකාලෝක වෙයි. මුඛයෙන් මහනෙල් මල් සුවඳ හමා බස්සි; ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි. ඔවුන් දෙතන මැද රන්වන් තිලකාභරණයක් මැවිණ. ඒ තිලකාභරණයෙන් අභිනව බාලාර්ක මණ්ඩලය සේ රශ්මි සමූහයෝ නික්මෙති. ඒ කුමාරිකාවන් දුටු දුටු පුරුෂයෝ බොහෝ සේ උමතු වූවන් මෙන් කාමයෙන් මත්ව විසංඥ වෙති. අහෝ කුශලාකුශල කර්මයන්ගේ ආනුභාවය නම් ඉතා නොසිතිය හැක්කේ මැයි.

i. විශිෂ්ට වූ රූ ඇති වුවත් හීන කුලයෙහි ඉපදුනේ කුමන කරුණක් නිසා ද?

ii. කළ ප්‍රාර්ථනයට අනුව ලැබුණු රූප සම්පත්තිය වර්ණනා කර ඇත්තේ කෙසේ ද?

iii. '' ඔවුන් දෙතන මැද රන්වන් තිලකාභරණයක් මැවිණ.'' මෙය ලිහිල් බසින් ලියන්න.

iv. ' බාලාර්ක මණ්ඩලය ' යන්නට විවරණ සපයන්න.

( ලකුණු 04 )

(ආ) එකල ඒ නුවර බිම්බිසාර රජ්ජුරුවන්ට පුත් වූ අභය නම් රාජ කුමාරයෝ ද ඒ වෛශ්‍යාව කරා වදනාහ. එසේ හෙයින් ඒ රාජකුමාරයන් ඇය කරා වැද ගිය දවසෙක ඒ රාජකුමාරයන් උදෙසා ඇට දරුගැබෙක් උපන. රාජකුමාරයෝ නොදන්නාහ. වෛශ්‍යාවෝ නම් දරුවන් ඇතත් නැත්තා සේ පුරුෂයන් වඤ්චා කරන ස්වභාව ඇත්තාහ. පුතුන් ලද කල වල දමන්නාහ. දූන් ලද කල නොහහවා වඩන්නාහ. එසේ වූ ධර්මතාවයක් ඇති හෙයින් ඕ ද තමා දරු ලදහයි නුවරට සැලව ගියේ නම් සල්ලාලයෝ මා කෙරෙහි සරු නැතිව යන්නාහ. මායමක් කරෙමියි සිතා පරිවාරස්ත්‍රියක කැඳවා '' මා කරා ආ කෙනෙක් ඇත් නම් මා ලෙඩහ'' යයි කියා පුරුෂයන් ඇතුළට නොගෙන''යි උගන්වා දසමසක් ගිය කල පුතකු වදා ඔහු කුලුමාලේලක ලවා මතුයෙහි කසළ ලා වසා '' මොහු නුවරින් පිටත ගෙන ගොස් උක්කාරභූමියෙහි ලා පියව''යි එම කෙල්ල අත යවා දම්මවා තමාගේ ගෙය සුවඳ පිරිබඩ ගෙන ලෙඩින් ගොඩ නැංගා සේ අතුරක් නො හහවා පෙර සේ ම වෙසෙයි.

i. වෛශ්‍යාවගේ ස්වභාවය කෙසේ විස්තර කර තිබේ ද?

ii. වෛශ්‍යාව දරුවා වළ ලූ පසු පෙනී සිටියේ කෙසේ ද?

iii. '' පුතකු වදා ඔහු කුලුමාලේලක ලවා මතුයෙහි කසළ ලා වසා '' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

iv. ' සුවඳ පිරිබඩ ගෙන' යන්නට කෙටි විවරණ සපයන්න.

( ලකුණු 04 )

(ඇ) සැවැත් නුවරට වැඩ ගෙපිළිවෙළින් සිඟා වඩනාසේක් බතක් නිසා සිඟා වඩනා ගමනක් නොවතත් අදින්නපුබ්බකගේ ගෙටත් වැඩි සේක. ඒ වෙලාවට මට්ටකුණ්ඩලී භිත්තිය දිසාවට මුහුණලා වැද හොත්තේ ය. බුදුහු තමන් වහන්සේ නොදක්නා නියාව දැන ශරීර ප්‍රදේශයකින් රස්කඳක් විහිදුවා වදාළසේක. ඒ රස්කඳ ගොසින් බිතක වැදගත. මට්ටකුණ්ඩලීත් බුදුරැස් දැක මියන වේලෙක රුවන්සක්මන මුනි පෙත්තක් ගෙනගොස් සිටුවාලා පෙත්ත දසාවට නමාලූ කලක් මෙන් මිදුල දසාවට නැමීලා වැදහොත් තැනැත්තෝ දෙතිසක් විතර මහාපුරුෂලක්ෂණයන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් හා බ්‍යාමප්‍රභාකේතුමාලයෙන් හා දසදිග පතළ සවනක් බුදුරසින් හා කප්ගිනි ගත් රුවන්මෙරක් මෙන් බබළමින් වැඩසිට බැලූබැලුවන් ඇස් සනහන සිතුසිතුවන් සිත් සනසන ඇසූඇසූවන් කන් සනහන අනල්ප කල්ප කෝටි ශතසහස්‍රයෙහි පිරූ සුචරිතය එක්කොට හඹා සිටුවාලූවාක් වැනි බුදුරුව දැක නුවණ නැති පියාණන්ගේ සමවාය නපුරු හෙයින් බුදුන් කරා ගොස් වැඳපියන්නට වේවයි දනක් දී පියන්නට වේවයි බණක් අසාපියන්නට වේවායි මේ සොළොස් හවුරුද්දෙන් අටහවුරුද්දක් විතරක් නොවීය.

i. බුදුන් වහන්සේ අදින්න පුබ්බක බමුණාගේ ගෙට වැඩියේ කුමන අරමුණකින් ද?
ii. බුදු රැස් දුටු මට්ටකුණ්ඩලී කළ ක්‍රියාව කුමක් ද?
iii. “ දස දිග පතළ සවනක් බුදුරසින් හා කප්ගිනිගත් රුවන් මෙරක් මෙන් බබළමින් ”මෙය ලිහිල් බසින් ලියන්න.
iv. “ බ්‍යාමප්‍රභා කේතුමාලායෙන් ” මෙය ගැන කෙටි විවරණයක් කරන්න.

( ලකුණු 04 )

(ඈ) එකල්හි උතුම් ගුණ ඇති පතිවත් වූ ඇගේ ශෝකාග්නි වේගය සුවාසූදහසක් යොදුන් උඩ නැගී සක් දෙව් රජහුගේ භවන හුණු කළේ ය. ශක්‍ර දේවේන්ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණු වෙසක් ගෙන ඇසිල්ලකින් අවුත් මහ බෝසතාණන් ඔත් ගල් මුදුනෙහි පෙනී කෙණ්ඩිකාවෙන් පැන් ගෙන මහබෝසතාණන් ඇඟ ඉස ලූහ. එකෙනෙහි විෂ නැසී වණය සුව ව කොතනක විදි බවක් නොදත හැකිවිය. මහබෝසත් එවිට අනුන් වෙහෙසන්නට මළ වෙස් ලා වැදහොත් එකකු පරිද්දෙන් වහා නැගිට සුවපත් වූයේ ය. චන්ද්‍රිකාව ද එසඳ සුවපත් ව සිටි ප්‍රිය ස්වාමි දැක බලවත් සොම්නසට පැමිණ, “ ස්වාමීනි, යම් බඳු නුඹ වහන්සේ මගේ ප්‍රියකල් වූ ඇඟ අමා පැන් ඉස නිදුක් කොට මගේ එ කළ කම් දුරු කොට ප්‍රිය වූ අප දෙදෙනා සමඟ කළ සේක් ද “ එසේ වූ නුඹ වහන්සේගේ ශ්‍රී පාදය වඳිමි. වැදහොත්තී ය. ඒ ශක්‍ර දේවේන්ද්‍රයෝ ද උන් දැක බලවත් වූ සොම්නසට පැමිණ “ මෙතැන්හි නො වසව, පර්වතයෙන් බැස මිනිස්සුන්ට විසය තැන නොවෙසෙත්ව”යි අවවාද කොට තමන්ගේ දිව්‍ය ලෝකයට ගියාහ.

චන්ද්‍රිකා ද “ ස්වාමීනි, මෙසේ වූ උපද්‍රව ඇති තෙනින් අපට ප්‍රයෝජන කිම් ද? අපගේ චන්ද්‍ර පර්වතයට පැමිණි ගල්ගිරිකුළු මුදුන්වල ද ගංහිස්වල ද මල් මුවරඳ ගල දියවළට බැස ස්නාන පානය කෙරෙමින් තුරු යටන්හි ඔවුනොවුන් සමඟ ප්‍රිය කථා කෙරෙමින් සැපසේ වසමහ’’ යි තමන් විසූ චන්ද්‍ර පර්වතයට ම ගියා හ’’යි යනාදීන් බුදුහු මේ ජාතක දේශනාව ගෙන හැර දක්වා වදාළ සේක.

i. පතිව්‍රතා බලය නිසා කුමක් සිදු වූයේ ද?
ii. පතිව්‍රතාව රැකි ඇයගේ ශෝක ගින්න කොතරම් දුරක් ඉහළට නැගිණි ද?
iii. “ ගල්ගිරිකුළු මුදුන්වල ද ගංහිස්වල මල් මුවරඳ ගල දියවලට බැස ” යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. ‘ රජහුගේ භවනය ’ යන පදයට කෙටි විවරණ සපයන්න.

( ලකුණු 04 )

(ඉ) වෙද වෙදඟ නිපුණෝ
සතර පිළිබිඹු දැපුණෝ
දිය වැඩෙයි දැපුණෝ
පසෙක උන්නුය පෙරෙවි බමුණෝ

යසින් නොකිලිටි යෝ
ලොව කප්තුරු සෙ සිටියෝ
වාද ඇසිටියටි යෝ
උන්නු සිටු තනතුරෙහි පිහිටියෝ

i. පෙරෙවි බමුණන් සතු හැකියාවන් මොනවා ද?
ii. සිටුවරු සිටි ආකාරය කෙසේ ද?
iii. දිය වැඩෙහි දැපුණෝ, යසින් නොකිලිටියෝ යන පද දෙක ලිහිල් බසින් ලියන්න.
iv. ‘ කප්තුර ’ යන පදයට කෙටි විවරණ ලියන්න. ( ලකුණු 04 )

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරකට අවස්ථා සම්බන්ධය දක්වන්න.

i. " කෙල්ලනි, තෙල තෙල් පුළුනෙන් හිඳ රැක තබ''
ii. " සබඳීනි, දැන් වෙළඳාණෝ කොයි ද?''
iii. " මෙ තැන්හි නො වසව පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන නොවෙසෙව ''
iv. " තොපි අප අනිත් බොහෝ ප්‍රශ්න විචාළේ වේ ද? අපිත් ඒ විසඳා කීමෝ වේ ද? ''
v. " යකෝ උන්ට ආණ්ඩුවෙන් පඩි ගෙවන්නෙ උගන්නනවට තමා ''
vi. " බඩගිනි යකෙකුට වැඩියෙ නපුරු දෙයක් තවත් මෙලොව නැහැ ''
vii. " ගුණ නැණ යුත් ඇදුරුතුමනි
පියවි මනසෙන් සිතා බලනුය ''

( ලකුණු 3 × 4 = 12 )

(එ) පහත සඳහන් පද්‍ය පන්තියේ භාෂා භාවිතය හා කාව්‍ය ආකෘතිය පිළිබඳ අවධානය යොමු කරමින් රසාස්වාදය කරන්න.

හිරු එළිය ගලා එයි කුටියට
කවුළු පියන් පත් අතරින්
සුපුරුදු විලසින්ම
එහෙත් කිම
ඒ හිරු එළිය අද දින
මලානික වී
අවදි නොකරන්නේ මසිත

ඇසෙන නෙක විහඟ ගී නද
අලුයමින් පෙරදා ලෙස
රිදුම් දෙනු විනා මා සිත
නොගෙනෙන්නේ කිම ද කිසි මිහිරක්

පිපී අතු අග නෙක මල්
සැලෙනා නමුදු මඳ පවනේ
හද සැනසූ සුවඳ පෙර දින
නොදැනෙන්නේ කිම ද අද දින

වෙළාගෙන මා ගත සිත
පාළුව ගලා විත් මා වට කොට
අත්මිදෙනු කෙලෙස ද
මේ රුදු පාළු හැඟුමින්

දුරු රටක ගිය මා පුතු
එන තුරු බලා හිඳිනට
හුරු කොට ගත යුතු නොවෙ ද
මා නෙතු

සඟවා වුව ද කඳුළැලි
දුරු රටක ගිය ඔහු
මා පුතු ද
මා හිත මිතුරු ද වන බැවින

( ලකුණු = 12 )

**02.** ගැමි ජීවිත අත්දැකීම් ආශ්‍රිතව උපමා හා ප්‍රස්තාව පිරුළුවලින් සියුම්ව හා රසවත්ව අදහස් ප්‍රකාශ කිරීම සද්ධර්ම රත්නාවලී කතුවරයාගේ රචනා රීතියේ විශේෂ ලක්ෂණයකි. නිර්දේශිත කතා ඇසුරෙන් විමසන්න.

නැහොත්

ජාතක කතා කරුවා චරිත නිරූපණයේ දී මිනිස් සිතේ සියුම් තැන් ස්පර්ශ කරමින් චරිත නිරූපණය කර තිබේ. නියමිත කතා දෙක ඇසුරෙන් විමසන්න.

( ලකුණු = 15 )

**03.** පහත (අ) කොටසේ ප්‍රශ්නය හා (ආ) කොටසින් එක ප්‍රශ්නයක් තෝරා ගෙන පිළිතුරු ලියන්න.

(අ) දඹදෙණි සාහිත්‍ය අවධියේ රචනා වූ ගද්‍ය සාහිත්‍ය කෘතියක් හා පද්‍ය සාහිත්‍ය කෘතියක් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(ආ) කාමයෙහි ආදීනව පෙන්වා දෙමින් වඩාත් විනිවිද භාවයකින් යුතුව ස්ත්‍රී පුරුෂ මනෝභාවයන් නිරූපණය කරන කෘතියක් ලෙස සද්ධර්මාලංකාරය හඳුන්වා දිය හැකිය. නියමිත කතාවස්තු දෙක ඇසුරෙන් විමසන්න.

නැතහොත්

කුමන අභියෝග පැමිණියත් දැඩි අධිෂ්ඨානයෙන් යුක්තව ක්‍රියා කළ හැකි නම් ඒවා ජයගත හැකි ආකාරය පූජාවලියේ කතා වස්තු තුළින් ඉස්මතු කර දක්වයි. නියමිත කතා වස්තු දෙක ඇසුරින් විමසීමක් කරන්න.

( ලකුණු = 15 )

**04.** අවස්ථෝචිත වර්ණනා භාවිතය තුළින් සංකල්ප රූප ජනනය කිරීම වැත්තෑවේ හිමියන්ගේ සුවිශේෂී හැකියාවයි. වර්ණනා තුනක් ඇසුරෙන් සනාථ කරන්න.

( ලකුණු = 15 )

**05.** ග්‍රාමීය පරිසරයේ දී හමුවන සැබෑ චරිත බැද්දේගම නවකතාව තුළින් නිරූපණය වෙයි. චරිත තුනක්වත් ඇසුරින් මේ කියමන විමසන්න.

( ලකුණු = 15 )

**06.** සංකීර්ණ මිනිස් සමාජයේ පවත්නා මිනිස් චර්යාවන් තත්වානුරූපීව ඉදිරිපත් කිරීමට නූතන කෙටි කතා කරුවා සමත් වී තිබේ. නියමිත කෙටිකතා තුනක්වත් ඇසුරෙන් මෙය විමසන්න.

( ලකුණු = 15 )

**07.** නූතන කවියා සමාජය සතුව පවත්නා සංකීර්ණ සමාජ ගැටලු ඉතා සූක්ෂම ව කලාත්මකව ඉදිරිපත් කරයි. නියමිත පද්‍ය පංති තුනක්වත් ඇසුරෙන් පහදන්න.

( ලකුණු = 15 )

**08.** සංකීර්ණ මානව චිත්තවේග නිරූපණය කරමින් ම ප්‍රබල නාට්‍යෝචිත අවස්ථා මතු කිරීම හේතුකොට ගෙන " පෙම තෝ ජායතී සොකෝ " නාට්‍යය ප්‍රේක්ෂක ආකර්ෂණය දිනා ගනී විමසන්න.

( ලකුණු = 15 )

***

## ඌව පළාත් අධ්‍යාපන  දෙපාර්තමේන්තුව.
## අ.පො.ස.  (උසස් පෙළ) - පෙරහුරු පරීක්ෂණය  -  2024

| සිංහල  -  11  පත්‍රය | පැය තුනයි.<br>අමතර කියවීම් කාලය -මිනිත්තු 10 |
|---|---|

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස්
- 1 කොටසේ 1 ප්‍රශ්නය ද, 11  කොටසේ 2,3   ප්‍රශ්න  ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- 1 කොටස, 11 කොටසේ  පිළිතුරුපත් සමඟ අමුණා භාරදෙන්න.

1කොටස

**01.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

**1.1.** මහාප්‍රාණ අක්ෂර පමණක් අන්තර්ගත වර්ණය තෝරන්න.
(1) ඣ, ෂ, හ, ඪ, ළ, ර, ශ
(2) බ, ළ, ධ, ණ, ය, ඤ, ඹ
(3) හ, ධ, ඣ, බ, ඪ, ඡ, එ
(4) ළ, ණ, ෂ, ධ, ණ, ය, ඤ, ඹ
(5) බ, ස, ඤ, ඣ, ධ, හ, ඪ

(..............)

**1.2.** නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) කාර්යාලය, කුරුළු, උච්ඡාරණය, මර්ධනය
(2) කාර්‍යාලය, කුරුලු, උච්ඡාරනය, මර්දණය
(3) කායීලය, කුරුළු, උච්චාරණය මර්දනය
(4) කාර්යයාලය, කුරුළු, උච්ඡාරණය, මර්ධණනය
(5) කාර්යාලය, කුරුලු, උච්චාරණය, මර්දනය,

(..............)

**1.3.** අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) ස්වයංක්‍රීය, ඖෂධාලය, විමර්ශනය, උද්දාමය, ශාස්ත්‍රීය
(2) උද්දාමය, ඖෂධාලය, විමර්ශනය, ශාස්ත්‍රීය, ස්වයංක්‍රීය
(3) ඖෂධාලය, උද්දාමය, ස්වයංක්‍රීය, විමර්ශනය, ශාස්ත්‍රීය
(4) ශාස්ත්‍රීය, උද්දාමය, විමර්ශනය, ස්වයංක්‍රීය, ඖෂධාලය
(5) විමර්ශනය, ස්වයංක්‍රීය, ඖෂධාලය,  ශාස්ත්‍රීය, උද්දාමය

(..............)

**1.4.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රේඵය යනු පිල්ලමක් වේ.
(2) රේඵය යනු ‘ ර් ’ අක්‍ෂරය වෙනුවට යොදන සංකේතයකි.
(3) රකාරාංශය වෙනුවට රේඵය යෙදිය හැකියි.
(4) රේඵය ස්වර අක්ෂරයකට ද යෙදිය හැකිය
(5) වචනයක ඇති ‘ ර් ’වෙනුවට රේඵය යෙදීමේදී ‘ ර් ’අකුරට පෙර ඇති අක්ෂරයට රේඵය යොදනු ලැබේ.

(..............)

1.5. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) විද්‍යා චක්‍රවර්ති, උද්‍යාන  බිම, සෞඛ්‍ය ඇමති, මැදුම් පිළිවෙත
(2) නැණ සයුර, ඔසු උද්‍යානය, ස්ථිර සාර,  අණ සක
(3) රුදුරු වෙස්, බොදු භක්තිය, මෘත ශරීරය, ප්‍රථම තැන
(4) දක්ෂිණ ද්වීපය, ජ්‍යෙෂ්ඨ පුත්‍රයා, කනිෂ්ඨ දූහිතෘ, මව් බිම
(5) ලක් දෙරණ,  ගඳ කිළිය,  අන්ධකාර කුටිය, මන්ද මාරුතය

(..............)

1.6. තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) තෘණ, පටිපාටි, කල්‍යාණී භෝජන
(2) වෙද, උෂ්ණ, දූදන, ක්‍රීඩා
(3) වෙළඳ, පිළිම, ප්‍රාණ, ප්‍රසන්න
(4) දීර්ඝ, චාරිත්‍ර, බෞද්ධ, නිදසුන්
(5) සොර, පැන, කොටස, ස්ථානය
(..............)

1.7. තත්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ශීර්ෂය, දකුණු, අග්නි, නිර්මල
(2) ඔසු, පැතුම්, මිත්‍ර, බිහිරි
(3) සසුන, ස්ථාන, සලකුණ, උණුසුම්
(4) වැකි, පින, වෙද, මැසි
(5) තිමිර, නර, වෛද්‍ය, ශිෂ්‍ය
(..............)

1.8. විශේෂණ, දකාරාර්ථ, අන්‍යාර්ථ, විභක්ති යන සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) පින්පව්, මිහිඳුම්, ශාක්‍යසිංහ, දසබල
(2) ශාක්‍යසිංහ, දසබල, පින්පව්, මිහිඳුම්
(3) ශාක්‍යසිංහ, පින්පව්, දසබල, මිහිඳුම්
(4) පින්පව්, දසබල, ශාක්‍යසිංහ, මිහිඳුම්
(5) දසබල, මිහිඳුම්, පින්පව්, ශාක්‍යසිංහ
(..............)

1.9. කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.
(1) කියුම්, බැලුම්, නැටුම්, රැගුම්
(2) මැරෙන, ඇඬෙන, තේරෙන, හැඟෙන
(3) මසන, ලියන, දරණ, වනසන
(4) සිතූ, බැලූ, හැඬූ, සේදූ
(5) බලන, දුවන, පීරන, සෝදන
(..............)

1.10. පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(අ) කරත වෙණ ගායනා සරියේ
(ආ) අසනුව ගී සුමිහිරි
(ඉ) හිනහේවි බෝනික්කා ඇස් නටවා බල බලා
(ඊ) බිම්ගය තුළ කළුවර වී පුරුදු එළිය ළඟ එනවා

(1) අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා අසම්භාව්‍ය ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා
(4) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අපර ක්‍රියා
(5) අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා
(..............)

1.11. තද්ධිත පදයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) ආදරවන්ත, ප්‍රේමවන්ත, කරුණාවන්ත, වාසනාවන්ත
(2) සිසිලස්, මුහුලස්, අල්ලස්, වරලස්
(3) සිහිති, පැනිති, කැබිලිති, කැදිති
(4) මුදුනත්, කොපුළත්, සවනත්, මුහුණත්
(5) නීතිඥ, ගණිතඥ, සංගීතඥ, විද්‍යාඥ
(..............)

1.12. උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) සුසිල්, සුනිල්, සුපුල්, සුරල්
(2) දුදන, දුගඳ, දුමන, දුවන
(3) කුමුදු, කුදිටු, කුකවි, කුපුරිස්
(4) අවවාද, අවමාන, අවසාන, අවනම්බු
(5) අනුගමනය, අනුනායක, අනුබල, අනුහුරු
(..............)

1.13. නිපාත පදයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) වහා, සෙද, හනික ඉක්මනින්
(2) ය, ම, ද, ච
(3) ඇයි, කිම්ද, මන්ද, මොකද
(4) අද, යළි, නැවත, ඉක්බිති
(5) මෙන්, බඳු, වගේ, සෙන්
(..............)

1.14. " අලංකාර පොකුණුවල සුපිපි මනස්කාන්ත නෙළුම් මල් දෙස බලන ඔවුහු අමන්දානන්දයට පත්වූහ "යන වාක්‍යයේ වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලටද?
(1) කෘදන්ත, සන්ධි, උපසර්ග
(2) උපසර්ග, කෘදන්ත, සන්ධි
(3) සන්ධි, උපසර්ග, කෘදන්ත
(4) කෘදන්ත, උපසර්ග, සන්ධි
(5) උපසර්ග, සන්ධි, කෘදන්ත
(..............)

**1.15.** සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) කරනු, සොයව, මසා, කියනුමැන
(2) සේදූහ, දිව්වා ය, නැටුවේ ය, වැන්දෙහි
(3) ඇසුවොත්, කරද්දී, බැලුවොත්, නැටුවා ය
(4) බලමින්, සොය සොයා, සිතමින්, වැඳ වැඳ
(5) සිතනු, බලා, සොයයි, විමසුවොත්

(...............)

**1.16.** සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) කුදිටු, අකුසල්, යාවජීව, අනුපම
(2) නැගෙනහිර, සුන්තුරු, තිනෙත්, පසැස්
(3) දේවදානය, මිනිස් මොළය, සතුරු බිය, ගුරුපහාරය
(4) ඇත්අස්, ගවමහීෂ ඉරහඳ, වතුපිටි
(5) දසබල, තුන්දොර, සතුරුබිය, මුහුදුසුළං

(...............)

**1.17.** එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

(1) උරෙනුර, යටෝවිට, සුරිඳු, මහීන්ද්‍ර
(2) ගොපල්ලා, මංකොල්ලය, මූලාරම්භය, කලායතනය
(3) කැටයම්, දඬුවම්, සිත්තම්, මඟුලැත්
(4) කොළොම්පුර, සම්මිත්, ළිංවතුර, අම්මල්
(5) ලිග්ගල, වප්පිහිය, සද්දහය, මලසුන

(...............)

**1.18.** ව්‍යාකරණානුකූල ව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

(1) ස්වර්ණමය, රජතමය, දාරුමය, ශෛලමය
(2) ගෙරවිලි. ලියවිලි, පැනිලි, ඇඬිලි
(3) අත්‍යුත්තම, අතිරස, අතිපිරිසිදු, අතිරේක
(4) පුනරුත්පත්තිය, නිරුදක, පුනරාගමනය, නිරවුල්
(5) ගල්හිත, මල්හිනාව, පාපියුම්, වතකමල

(...............)

**1.19.** ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

(1) අම්මා ද මම ද විහාරස්ථානයට යන්නෙමි.

(2) 'මා වෙහෙස වී වැඩ කරති' යි සමහරු විශ්වාස කරති.

(3) අපි තරගයෙන් ජය ලබද්දී ගුරුවරු ප්‍රශංසා කළහ.

(4) විභාග අපේක්ෂකයෝ විභාග මධ්‍යස්ථානයට පැමිණ නැත.

(5) චිත්‍ර ශිල්පීන් අපූරු දර්ශන සිතුවමට නගති.

(...............)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.

(1) ඔවුන් තම තමන්ගේ හැකියාවන් අවබෝධ කරගත යුතුය.

(2 ) ' අපි අපේ ගමන යමු 'යි දරුවෝ කියයි.

(3) ඒ ගමන පරීක්ෂාකාරීව යන්න ඕනෑ.

(4) කොහොමද ගම්මැද්දෙ තොරතුරු?

(5) මං එනකල් ඉදිකඩ ළඟ නතර වී ඉන්න. (...............)

( ලකුණු 1×20=20යි.)

2. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉලෙක්ට්‍රෝනික මාධ්‍යයන්ගේ දැවැන්ත ආගමනය එකිනෙකා පරයන තරගකාරීත්වයෙන් දැඩි වාණිජත්වයට බර වූ එකක් විය. එය පොදු ජනයාගේ විනෝදාස්වාදයට මනා ප්‍රතිචාරයක් දැක්වුව ද සාහිත්‍ය කලාදියෙහි රසඥතාව වර්ධනය කිරීමට ප්‍රමාණවත් උත්සාහයක් නොදැරීය. පුවත්පත්වලින් හා සඟරාවලින් කවර නම් මෙහෙයක් වූව ද අද ඊට තම කාලය වැය කරන්නෝ දුලබ වෙති. රූපවාහිනිය හා එෆ්. එම්. තරංග පොදු මිනිසාගේ විවේකය මුළුමනින් ම අත්පත් කරගෙන තිබේ.

වැඩිහිටියන් මතු නොවයි දරුවන් අතර ද විටින් විට මතුවන ප්‍රචණ්ඩ හැසිරීම් හා කෲරකම් ජනමාධ්‍යයෙන් පවා දක්නට ලැබේ. එසේ වී ඇත්තේ මිනිසුන් තුළ දයාව, කරුණාව, ඉවසීම, මැදිහත් බව යන උතුම් ගුණාංග පිරිහී ගොස් තිබීම නිසා බව පැහැදිලි ය. එකී මානව ගුණාංගවලින් මානව සන්තානය පෝෂණය කරන්නේ ආගම විෂය හැරුණු කොට සාහිත්‍යයයි. දරුවන් සාහිත්‍ය රුචියෙන් තව තවත් ඈත් වුවහොත් හෙට ලෝකයේ අප අසන දකින කුරිරුකම් ඉහවහා යනු ඇත. වත්මන් සමාජයේ ජීවත්වන සම්භාවනීය පුරවැසියෙකු වන ගුරුවරයාත් හෙට ලොව හිමි ඔබටත් එයින් සමාජය ගලවා ගැනීමේ යුතුකම පැවරී තිබේ. සිංහල භාෂා අධ්‍යයනය දිනෙන් දින ම බිඳවැටෙන බවත් එය පළවන පොත පතින් පමණක් නොව ජනමාධ්‍ය හරහා ද දැකිය හැකි බව විද්වත්හු පෙන්වා දෙති. සිංහලය පමණක් නොව අනෙක් භාෂා අධ්‍යයනයනුත් එසේ ය. සිංහලය වෙනුවට ඇති බසක් හෝ දියුණු වන්නේ නම් ඊට කම් කිම ? වෙන බසකින් හෝ සන්නිවේදනයක් අධ්‍යයනයත් කළ හැකිය. එහෙත් අධ්‍යාපනඥයන් පෙන්වා දෙන පරිදි දරුවාගේ ප්‍රාථමික හා ද්විතීය මට්ටමේ ඉගෙනුමට මව්බස මහත් පිටුවහලක් වන බවට කරුණු නොදනිත් ද? සිංහලය වෙනුවට අන් බසක් හෝ උගෙන ඉහළම තැනකට යෑමට හැකි'යැයි විශ්වාස කරන තැනැත්තන්ට මතක් කළ යුත්තක්ව ඇත. ඒ සිංහල බස සමග මව්බසින් ලද සාහිත්‍ය ඇසුරත් ඒ හා ම බිඳවැටෙන බවයි. එහි ප්‍රතිඵලය නම් මනුෂ්‍ය සංහතිය විසින් නිර්මිත සංස්කෘතිය භුක්තිය විඳීමට වරම් නොලැබුවා වූ ද අනාගතයේ මෙරට ස්වකීය ආධ්‍යාත්මයෙන් සිස් වූ ද පුස් මිනිසුන් කැලක් බිහිවීම නොවේ ද?

i. ඉලෙක්ට්‍රෝනික මාධ්‍යයන්ගේ පැමිණීම මෙහි විස්තර කර ඇත්තේ කෙසේ ද?
ii. ඉලෙක්ට්‍රොනික මාධ්‍යයන්ගේ පැමිණීමෙන් සිදුවන වාසියක් හා අවාසියක් මෙහි දැක්වේ. ඒවා මොනවා ද?
iii. පුද්ගලයන් සතු ප්‍රචණ්ඩ හැසිරීම් හා කෲරකම්වලට හේතු ලෙස මෙහි සඳහන් කර ඇත්තේ කුමන සාධක ද?
iv. මානව ගුණාංගවලින් මානව සන්තානය පෝෂණය කළ හැක්කේ කිනම් විෂයන් තුළින් ද?
v. මෙහි සඳහන් පරිදි දරුවාගේ ප්‍රාථමික හා ද්විතීයක මට්ටමේ ඉගෙනුමට බෙහෙවින් පිටුබල වන්නේ කුමක් ද?
vi. සිංහල බස සමඟ මව්බසින් ලද සාහිත්‍ය ඇසුර පුද්ගලයා වෙතින් ගිලිහී යාමෙන් ඇති විය හැකි අනිසි ප්‍රතිඵලය කෙසේ වී ද?

**(ලකුණු 2×6=12යි.)**

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශ අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සමාජයේ යහපත් ජීවිතයක් ගත කිරීමේ දී අපට ආවේණික වූ සාරධර්ම මෙන් ම වරණය කොට ගත් ජගත් සාධු චර්යා රටා ද තොරතුරු හා තාක්ෂණික විවිධ මෙවලම් ද අපේ සංස්කෘතිකාංග බවට පත් කරලීම අත්‍යවශ්‍ය වනු ඇත. එසේ නොවුනහොත් සිදුවෙමින් පවත්නා ගෝලීයකරණය හමුවේ අපට අනන්‍ය වූ හා සංරක්ෂණය කොටගෙන එමින් ඇති සාරාංග සමුච්චය ඉදිරි පරපුරට සම්ප්‍රේෂණය නොවනු ඇත. නිදසුන් වශයෙන් අප සතු, අපට උරුම මාතෘ භාෂාව දෙසට යොමු විය හැකිය. වචනයේ අර්ථයෙන් ම මෙය මාතෘ, පීතෘ හා සමාන වන්නේ ය.

අධ්‍යපනය මගින් සිදුවිය යුත්තේ තම මව්බස නිවැරදි ව සම්මතානුකූල ව හැසිරවීමට මග පෙන්වීම ය. වැඩිදුරට නොගොස් බැලුවහොත් ශ්‍රී ලංකාවේ සංස්කෘතිය තුළ සාඩම්බරයෙන් මෙතෙක් කල් ඥාතීන් ආමන්ත්‍රණය කිරීමට අනන්‍ය වූ සුමිහිරි වදන් මාලාවක් පවා ඩඩා, ඩැඩී, අන්කල්, ඇන්ටි වැනි විලාසිතාවකට හෝ රටාවකට හැඩගැසෙමින් පවතින සෙයක් පෙනේ. චිරාත් කාලයක් මුළුල්ලේ බස පිළිබඳ ව පැවත එන අභිමානය ගැන ඇඟයීමක් හෝ ගෞරව පූර්වක බවක් ගොඩනැගෙනු නොපෙනේ. වන්දනීය වූ ද පූජනීය වූ ද මව් බසට දැනට අත්වී ඇති ඛේදනීය ඉරණම තවදුරටත් සාක්ෂිප්ත ව හුවා දැක්වීමට අපේක්ෂා කරනුයේ මේ සඳහා ද අධ්‍යාපනය සතු ව පුළුල් භූමිකාවක් හිමිවන බව සපථ කරවීමට ය. භාෂාමය හැකියාව ගුණාත්මක අධ්‍යාපනයේ කශේරුකාව වන බැවිනි.

**(ලකුණු 13යි.)**

3. දී ඇති මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

i. විදේශ ණය ප්‍රතිපත්ති හමුවේ ශ්‍රී ලංකාවට මුහුණපෑමට සිදුවන අනාගත අභියෝග
ii. තාක්ෂණික මෙවලම් හේතුවෙන් පොත් පත් පරිහරණයෙන් දුරස් වන ශිෂ්‍ය ප්‍රජාව
iii. කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ කාලීන වැදගත්කම හා ඒ මගින් පරිසරයට සිදුවන යහපත
iv. අධ්‍යාපනික විෂය ධාරාවට ක්‍රීඩාව මෙන් ම සෞන්දර්ය විෂය ධාරාව අනිවාර්ය කිරීමේ වැදගත්කම
v. අපනයන භෝග වගාව කෙරෙහි ජනතා අවධානය යොමු කරවීමේ යෝග්‍යතාවය

(ලකුණු 25යි.)

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. නදී තුමූ මනරම් දසුන් මවමින් ගලා බසින්නේ ය.
ii. කැපවන්නෝ ජයග්‍රහණයේ මිහිරි යූෂ පානය කරන්නෝ වෙති.
iii. ඔවුහු තරගයෙන් දිනති'යි ක්‍රීඩා ලෝලීහු සිතති.
iv. විදුහල්පතිතුමා හෙවත් විදුහල්පතිතුමිය රැස්වීමේ මුලසුන හොබවන්නා ය.
v. අක්කා ද නුඹ ද මල්ලී ද වෙළඳපොළට යන්නෝය.

(ලකුණු 1×5=05යි.)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

i. ග්‍රාම නිලධාරීහු අසරණ ජනතාවට සහනාධාර බෙදා දුන්හ.
ii. හෙතෙම නව නිපැයුම් රසක් හඳුන්වා දෙයි.
iii. ඇමතිතුමා ආරෝග්‍යශාලා සියල්ල නවීකරණය කරයි.
iv. මම අසරණ දියණියක අනතුරින් බේරාගත්තෙමි.
v. තෝ අපව අතරමං කරවහි. (ලකුණු 1×5=05යි )

(ඇ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

i. ( ඇතමෙක් / ඇතමෙකු ) වෙරළාසන්න ප්‍රදේශයේ ජීවත් ( වෙයි / වෙති )
ii. ( මම / මා ) වටපිට බලද්දී සියල්ලෝ ම පුදුම ( විය / වූහ )
iii. ( නිවේදකයා හෝ නිවේදිකාව ) ( නිවේදිකාව හෝ නිවේදකයා ) සභාව ( අමතන්නීය / අමතන්නාහ )
iv. මහාචාර්ය එදිරිවීර ( සරච්චන්ද්‍රයෝ / සරච්චන්ද්‍රයාණන් ) මළගේ ඇත්තෝ නවකතාව ( ලිව්වේ ය / ලියූහ )
v. දෙමාපියෝ ( දරුවෝ / දරුවන් ) ලවා ගෙමිදුල් පවිත්‍ර ( කරවයි / කරවති )

(ලකුණු 1×5=05යි.)

5. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායේ අනු අංගය ලියන්න.

i. ශිෂ්‍යාධාර අපේක්ෂා කරන විශ්ව විද්‍යාල ශිෂ්‍යයෝ අයදුම්පත් ඉදිරිපත් කරති.
( ශිෂ්‍යාධාර - සමාස, අපේක්ෂා කරන - කෘදන්ත, ශිෂ්‍යයෝ - විභක්ති )

ii. මින්රළ ගංවෙරළට රැස් වී වෙණ නදට ම සවන් යොමු කළහ.
( ගංවෙරළට - සන්ධි, රැස් වී - ක්‍රියාපද, ම - නිපාත )

iii. නියගයෙන් පීඩා විඳි ජනතාවට කඩිනමින් සහනාධාර ලබා දෙන්නට ඇමතිතුමා තීරණය කළේ ය.
( නියගයෙන් - විභක්ති, සහනාධාර - සන්ධි, දෙන්නට - ක්‍රියාපද )

iv. සුසිනිඳු මල් ඇතිරියෙහි කිඳුරා වැතිර සිටි විට කිඳුරිය තම නැටුම් නවතා වික්ෂිප්ත වූවා ය.
( සුසිනිඳු - උපසර්ග, ඇතිරියෙහි - විභක්ති, නැටුම් - කෘදන්ත)

v. සැදැහැවත්තු අභිනවයෙන් ඉදිකළ ස්වර්ණමය ප්‍රතිමාව නිරුපද්‍රිත ව තැන්පත් කළහ.
( සැදැහැවත්තු - විභක්ති, ස්වර්ණමය - තද්ධිත, නිරුපද්‍රිතව - සන්ධි )

(ලකුණු 3×5=15යි.)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන් තුළ දී ඇති පද අතුරින් තෝරා ලියන්න.

i. සූර්ය ........................... ලොවට ම සතුට ගෙන දෙයි.
ii. ......................... ගඟ නීල වර්ණයෙන් සුපැහැදිලි ව දර්ශනය විය.
iii. ............................. නාටක කිසිවක් තමා ප්‍රිය නොකරන බව හෙතෙම පැවසී ය.
iv. ......................... වස්තූන් නිරීක්ෂණය කිරීමට කුඩා ළමෝ ප්‍රිය කරත්.
v. අලුසල් ................................. සඳහා ප්‍රදේශවාසීන්ගේ දායකත්වය නොමඳ ව ලැබිණි.
Vi. නව රඟහලේ පැවැති .............................. නළු නරඹන්නට බොහෝ දන රැස්වූහ.

( කෙළි, ආකාශ, මඟුල, ක්‍රීඩා, මංගල්‍යය, අහස් )

(ලකුණු 1/2×6=03යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර දක්වන්න.

i. අති + උදාර
ii. ගොපලු + ආ
iii. බුද්ධි + ඉන්ද්‍රිය
iv. වි + අවුල
v. ලිප් + ගල
vi. නෙළුඹු +මල්

(ලකුණු 1/2×6=03යි.)

(ඉ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

i. ඔහු කතුරෙන් කඩදාසි කැපීය.
ii. ගුරුවරුන් විසින් ශිෂ්‍යයෝ යහමගට ගනු ලබති.
iii. ඇය නිවසෙන් පිටව ගියේ සරසවියට ප්‍රවේශ වීමට ය.

(ලකුණු 1/2×6=03යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස ලියන්න.

අනේ එය මහත් ව්‍යසනයකි දුර්භාග්‍යසම්පන්න අත්දැකීමකි නොසිතූ මොහොතක මුහුණ පෑමට සිදු වූ ඉරණමකි දෛවයේ සරදමකි පවුලේ වැඩිමහල් දරුවා කුලුදුලා ගේ මෙම ප්‍රකාශය දෙමාපියන්ට අදහාගත හැකි වූවා ද

(ලකුණු 1×3=03යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

i. “ අපි හෙට දිනයේ පන්ති පිරිසිදු කිරීමට වේලාසනින් ම සහභාගී වෙනවා "යි සිසුහු පවසති.

ii. “ දරුවනි, පෙළපොත් පිරිසුදුව තබා ගන්න "යි ගුරුතුමා කීය.

ii. “ මම ඊයේ විනෝද චාරිකාවට සහභාගී වුණේ නෑ " චමිල කීය.

(ලකුණු 1×3=03යි.)

7. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භාෂණය <u>අනායාසයෙන්</u> සිදුවන්නක් වුවද ලේඛනය එබන්දක් නොවේ. එය <u>ආයාසයෙන්</u> පුහුණු කළ යුත්තකි. දරුවකු අනායාසයෙන් කතා කිරීමටත්, අසා තේරුම් ගැනීමටත් පුහුණු වන්නේ තම මව් භාෂාවය. එය ප්‍රථම භාෂාව යනුවෙන් ද දැක්වේ. දරුවා තම කුඩා <u>අවදියේ</u> දී තමා අවට පරිසරයේ සිටින අය කථා කරන ආකාරය <u>අනුකරණය</u> කිරීම <u>ආරම්භ</u> කරයි. එය අවුරුදු තුන හමාරක් පමණ වන විට සම්පූර්ණ වන අතර, එම කාලය වන විට ඒ මගින් <u>සන්නිවේදනය</u> කිරීමට එම දරුවා සමර්ථ වෙයි. මෙය විස්මයජනක ක්‍රියාවලියකි. එය මානව <u>සත්ත්වයා</u> පිළිබඳ ව පමණක් ම පවතී.

i. ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස්කර ලියන්න.
ii. මෙහි දැක්වෙන අවධාරණාර්ථයේ නිපාත පද 2ක් ලියන්න.
iii. මෙහි අන්තර්ගත අඝෝෂ මහාප්‍රාණ අක්ෂර ඇතුළත් වචන 3ක් ලියන්න.
iv. දරුවා, සන්නිවේදනය, තේරුම් යන වචනවල අන්තර්ගත පිල්ලම් නම් කරන්න.
v. ඝෝෂ මහප්‍රාණ අක්ෂරයක් හා මූර්ධජ අක්ෂර දෙකක් එක ළඟ යෙදුණු වචනයක් ලියන්න.

**(ලකුණු 3×5=15යි.)**

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. කාලාර්ථයේ නිපාත

ii. අන්‍යාර්ථ සමාසය

iii. ද්විත්වරූප සන්ධිය

iv. අසම්භාව්‍ය ක්‍රියාව

v. භාව කාරක කෘදන්ත

**(ලකුණු 5×3=15යි.)**

# පිළිතුරු පත්‍රය 2024

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01. | 1 – 3 | 2 – 5 | 3 – 2 | 4 – 2 | 5 – 4 | 6 – 1 |
| | 7 – 4 | 8 – 3 | 9 – 3 | 10 – 5 | 11 – 2 | 12 – 1 |
| | 13 – 5 | 14 - 5 | 15 – 4 | 16 – 4 | 17 – 4 | 18 – 3 |
| | 19 – 2 | 20 – 1 | | | | |

**02. (අ)**

1. එකිනෙකා පරයන තරගකාරීත්වයෙන් දැඩි වාණිජත්වයට බර වූ එකක් ලෙස.
2. වාසි - පොදු ජනතාවගේ විනෝදාස්වාදයට මහා ප්‍රතිචාරයක් දැක්වීම.
3. අවාසි - සාහිත්‍ය කලා ආදියෙහි රසඥතාවය වර්ධනය කිරීමට ප්‍රමාණවත් උත්සාහයක් නොදැක්වීම.
4. මිනිසුන් තුළ දයාව, ඉවසීම, මැදිහතබව යන ගුණාංග පිරිහී ගොස් තිබීම නිසා.
5. ආගම, සාහිත්‍යය
6. මව්බස
7. මනුෂ්‍ය සංහතිය විසින් නිර්මිත සංස්කෘතිය භුක්ති විඳීමට වරම් නොලැබුවා වූ ද අනාගතයේ මෙරට ස්වකීය අධ්‍යාත්මයෙන් හිස් වූ ද පුස් මිනිසුන් කැලක් බිහිවීම.

**(ආ)** සාරාංශයේ වචන සංඛ්‍යාව **55 - 65** අතර විය යුතුය.

**04. (අ)**

i. නදී තුමූ මනරම් දසුන් මවමින් ගලා බසින්නාහ. / බසිනේනාය.
ii. නිවැරදි වාක්‍යයකි.
iii. ඔවුන් තරගයේ දිනති'යි ක්‍රීඩා ලෝලීහු සිතති.
iv. විදුහල්පතිතුමා නොහොත් විදුහල්පතිතුමිය රැස්වීමේ මුලසුන හොබවන්නා ය.
v. අක්කා ද නුබ ද මල්ලී ද වෙළඳපොළට යන්නෙහු.

**(ආ)**

i. ග්‍රාම නිලධාරීන් විසින් අසරණ ජනතාවට සහනාධාර ලබා දෙන ලදී.
ii. ඔහු විසින් නව ලිපියම රැසක් හඳුන්වා දෙනු ලබයි.
iii. ඇමතිතුමා විසින් ආරෝග්‍ය ශාලා සියල්ල ම නවීකරණය කරනු ලබයි.
iv. මා විසින් අසරණ දියණියක් අනතුරින් බේරාගනු ලැබුවා ය.
v. තා විසින් අපි අතරමං කරවනු ලබමු.

**(ඉ)** i. ඇතමෙක් / වෙති. ii. මා / වූහ. iii. නිවේදකයා හෝ නිවේදිකාව / අමතන්නි ය.
iv. සරච්චද්‍රයෝ / ලියූහ. v. දරුවන් / කරවති.

**05. 1.** විභක්ති, වර්තමාන කෘදන්ත, ප්‍රථමා
**2.** ගාත්‍රාක්ෂර ලෝප, පූර්ව ක්‍රියා, අවධාරණාර්ථයේ නිපාත
**3.** කරණ, පූර්වස්වර ලෝප සන්ධිය, අපර ක්‍රියා
**4.** භූෂණාර්ථයේ, ආධාර, භාවකාරක කෘදන්ත
**5.** ප්‍රථමා, නිෂ්පන්නාර්ථයේ, ආගම සන්ධිය



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

06. (අ) i. මංගල්‍ය ii. අහස් iii. ක්‍රීඩා
iv. ආකාශ v. මඟුල vi. කෙටි

(ආ) i. අත්‍යුදාර ii. ගොපල්ලා iii. බුද්ධීන්ද්‍රිය
iv. වියවුල් v. ලිග්ගල vi. නෙළුම්මල්

(ඉ) i. ප්‍රථමා, කරණ ii. කර්තෘ, ප්‍රථමා iii. අවධි, සම්ප්‍රධාන

(ඊ) අනේ ! එය මහත් ව්‍යසනයකි; දුර්භාග්‍යසම්පන්න අත්දැකීමකි; නොසිතූ මොහොතක මුහුණ පෑමට සිදු වූ ඉරණමකි; දෛවයේ සරදමකි. පවුලේ වැඩිමහල් දරුවා ( කුලුදුලා ) ගේ මෙම ප්‍රකාශය දෙමාපියන්ට අදහාගත හැකි වූවා ද?

(උ) 1. තමන් පසු දින පන්ති පිරිසිදු කිරීමට වේලාසනින් ම සහභාගී වන බව සිසුහු පවසති.
11. ගුරුතුමා දරුවන් අමතා පෙළ පොත් පිරිසිදුව තබා ගන්නා ලෙස කීය.
111. තමා පෙර දින විනෝද චාරිකාවට සහභාගී නොවූ බව චමිල කීය.

7. i. අනුකරණය, අවදියේ, අනායාසයෙන්, ආයාසයෙන්, ආරම්භ, සත්ත්වයා, සන්නිවේදනය

ii. ම , ව

iii. ලේඛනය, ප්‍රථම, කථා

iv. කෙටි පාපිල්ල, ඇලපිල්ල / කෙටි ඉස්පිල්ල, කොම්බුව හා දීර්ඝත්ව ලකුණ / කොම්බුව හා දීර්ඝත්ව ලකුණ, කෙටි පාපිල්ල

v. භාෂාණය.

8. නිර්වචනයට ලකුණු 2 යි. උදාහරණවලට ලකුණු 3 යි.



PAST PAPERS WIKI
(13) WWW.PastPapers.WiKi (13)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න